28

SCAN

# ශ්‍රී ලංකාවේ පහත රට සිංහල වතු කම්කරු කාන්තාවන්ගේ සාක්ෂරභාවය පිළිබඳ අධ්‍යයනයක්

331.4 S36

(දෙණියාය වත්ත ඇසුරෙන්)

අධ්‍යාපනපති උපාධිය සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධනය

එස්. ආර්. සිරිවර්ධන
අධ්‍යාපනපති උපාධි අපේක්ෂිකා

REFERENCE ONLY

අධ්‍යාපන අංශය,
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය,
නාවල,
නුගේගොඩ.
1995. 10. 30

OPEN UNIVERSITY
45543

45543

- සාරාංශය -

ශ්‍රී ලංකාවේ පහතරට සිංහල වතු කම්කරු කාන්තාවන්ගේ සාක්ෂරතාවය පිළිබඳව කරන ලද සමීක්ෂණාත්මක අධ්‍යයනයක් ඇසුරින් මෙම නිබන්ධනය සකස්කර ඇත. අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස දෙණියාය වත්ත තෝරා ගන්නා ලදි. මෙහිදී වරප්‍රසාද නොලත් සමාජ පන්තියක් නියෝජනය කරමින් වතු කම්කරුවන් වශයෙන් සේවය කරන පහත රට සිංහල කම්කරු කාන්තාවන්ගේ සාක්ෂරතාවය පිළිබඳව අධ්‍යයනය කරන ලදි.

මෙම කම්කරු කාන්තාවන්ට තම දෛනික ජීවිතයේදී අත්‍යාවශ්‍ය වන අධ්‍යාපනයේ අවම මට්ටම ලෙස සලකනු ලබන සාක්ෂරතාවය හෙවත් අකුරු කියවීමේ හා ලිවීමේ හැකියාවත් සංඛ්‍යා හැකියාවත් තිබේදැයි ගුණාත්මක විශ්ලේෂණයක් කිරීමට මෙහිදී බලාපොරොත්තු විය. එමෙන්ම සාක්ෂරතාවය ප්‍රශස්ත මට්ටමක තිබෙන කාන්තාවන් ඉන් නිසි ප්‍රයෝජන ලබාගන්නේද, සාක්ෂරතාවය නොමැති කාන්තාවන් එ නිසා මුහුණ පෑ විවිධ ගැටළු මොනවාද යන්නත් විමර්ශනය කිරීමට මෙම අධ්‍යයනයෙන් බලාපොරොත්තු විය. සාක්ෂරතාවය නොමැති කාන්තාවන් එවැනි තත්ත්වයකට පත්වීමට බල පෑ සමාජ ආර්ථික හේතු පිළිබඳ විමසා බැලීමටත් සාක්ෂරතාවය තිබෙන කාන්තාවන් එය වැඩිදියුණු කරගැනීමටත් සාක්ෂරතාවය නොමැති කාන්තාවන් එය ලබාගැනීමටත් නැඹුරුවක් ඇත්දැයි විමසා බැලීමටද මෙම අධ්‍යයනයෙන් බලාපොරොත්තු විය.

පර්යේෂණය වඩා නිවැරදි හා ඵලදායි කර ගැනීමේ අරමුණින් ප්‍රදේශය පිළිබඳව භූගෝලීය අධ්‍යයනයක් කරන ලද අතර පහත රට සිංහල වතු කම්කරු කාන්තාවන් එම වෘත්තියට පිවිසුන ආකාරයත් ඔවුන්ගේ ජීවන රටාවේ ආවේණික ලක්ෂණ පිළිබඳවත්, සාක්ෂරතාවය යනු කුමක්ද යන්න පිළිබඳවත් විශේෂ අධ්‍යයනයක් කරන ලදි.

මෙවැනි අධ්‍යයනයක් කිරීමට සූදානමක් වශයෙන් මෙම පර්යේෂනයට පෙර කාන්තාවන්ගේ අධ්‍යාපනය ගැනත්, සාක්ෂරතාවය ගැනත්, විශේෂයෙන්ම කම්කරු කාන්තාවන්ගේ අධ්‍යාපනය හා සාක්ෂරතාවය සම්බන්ධවත්, එයට බලපාන සාධක හා සාක්ෂරතාවය නොමැති

කාන්තාවන් ඒ නිසා මුහුණපාන ගැටළු සම්බන්ධවත් ලියවී ඇති ලිපිලේඛන හා පොත්පත් කිහිපයක් අධ්‍යයනය කරන ලදී. පර්යේෂණ ග්‍රන්ථ වශයෙන් පෙරදිග රටවල් කිහිපයක කරන ලද අධ්‍යයනයක් කිහිපයකින් හා ශ්‍රී ලංකාවේ මේ සම්බන්ධව කරන ලද අධ්‍යයනයන් කිහිපයකින් මෙම අධ්‍යයනයට ඵලදායි තොරතුරු රැසක් ලබාගන්නා ලදී.

පර්යේෂණ ගැටළුව සම්බන්ධ උපන්‍යාස 05 ක් මෙම අධ්‍යයනය සම්බන්ධ මූලාශ්‍ර හා වෙනත් තොරතුරු විමර්ශනයෙන් පසුව සකස්කර ගන්නා ලදී. මෙය පහත රට සිංහල වතු කම්කරු කාන්තාවන් පිළිබඳව තෙරෙන අධ්‍යයනයක් බැවින් පහත රට වතු සියල්ලම සලකා බලා පහත රට වත්තක තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ සියල්ල අඩංගු විශාලම වත්ත අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස තෝරාගන්නා ලදී. මෙම අධ්‍යයනය සඳහා දෙණියාය වත්තේ සේවය කරන සිංහල කම්කරු කාන්තාවන් පමණක් යොදාගත් අතර ඔවුන් නේවාසික හා නේවාසික නොවන වශයෙන් පදිංචියෙහි ස්වභාවය සලකා බලා ප්‍රධාන කොටස් දෙකකට වෙන්කර ගන්නා ලදී.

පර්යේෂණ උපකරණ වශයෙන් සාක්ෂරභාවය ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව විමසා බැලීමට ප්‍රමිත පරීක්ෂණයක් පවත්වන ලදී. මෙහිදී විෂය ක්ෂේත්‍ර තුනක් එනම්, කියවීම, ලිවීම හා සංඛ්‍යා හැකියාව පදනම් කරගෙන ප්‍රශ්නපත්‍ර සකස්කර ගන්නා ලදී. නියැදි ජනගහනය සමඟ සම්මුඛ සාකච්ඡාවක් පවත්වා ඒ මඟින් පිළිතුරු ලබාගැනීමට ප්‍රශ්නාවලියක්ද, නියැදියට අයත් නොවන ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයන් කිහිප දෙනෙක් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වා තොරතුරු ලබාගැනීමට සම්මුඛ සාකච්ඡා ෂෙඩ්‍යූලයක් ද පර්යේෂණ උපකරණ වශයෙන් උපයෝගී කර ගන්නා ලදී. ක්ෂේත්‍ර නිරීක්ෂණය ද මෙම අධ්‍යයනයේදී ලබාගත් තොරතුරු වල විශ්වසනීයත්වය තහවුරු කර ගැනීමට ඉවහල් කර ගන්නා ලදී.

දත්ත විශ්ලේෂණයේදී සරල සංඛ්‍යාන ක්‍රම කිහිපයක් උපයෝගී කර ගන්නා ලදී. ලබාගත් දත්ත ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව විග්‍රහ කර ඉදිරිපත් කරන ලදී.

සාක්ෂරභාවය මැනීම සඳහා යොදාගත් ප්‍රමිත පරීක්ෂණයේ ප්‍රතිඵල ඒ ඒ විෂය ක්ෂේත්‍ර යටතේත් කම්කරු කාන්තාවන්ගේ වයස් මට්ටම්, පදිංචියේ ස්වභාවය, රැකියා ක්ෂේත්‍රයේ ස්වභාවය හා විධිමත් අධ්‍යාපන මට්ටම් අනුවත් සංසන්දනාත්මකව විග්‍රහ කරන ලදි. සම්මුඛ සාකච්ඡාවක් ඇසුරින් සම්පූර්ණ කර ගැනීමට නියැදි ජනගහනයට ඉදිරිපත් කළ ප්‍රශ්නාවලියට ලැබුණු පිළිතුරු ඇසුරින් රැස්කරගත් දත්ත ද මෙහිදී විශ්ලේෂණය කර ඇත.

විශ්ලේෂණය කරන ලද දත්තයන්ට අනුව පහත රට සිංහල වතු කම්කරු කාන්තාවන්ගේ සාක්ෂරභාවයේ ස්වභාවයත් ඒ සම්බන්ධව පවත්නා ගැටළු හා ඒවා කෙතෙක් දුරට සමාජ ආර්ථික තත්ත්වයන් හා බැඳී පවතී ද යන්නත් පැහැදිලි වේ. මෙම කාන්තාවන්ගේ සාක්ෂරභාවයේ ස්වභාවය පිළිබඳව විමසීමේදී නියැදි ජනගහනයෙන් සියයට 26 ක් ඒ සම්බන්ධව ප්‍රශස්ත මට්ටමක පසුවන බව පැහැදිලි වූ අතර සියයට 10 ක් සාමාන්‍ය මට්ටමකත් සියයට 64 ක් දුර්වල මට්ටමකත් පසුවන බව පැහැදිලි විය. මැදිවියෙහි සහ වැඩිහිටි වියෙහි පසුවන කාන්තාවන්ට වඩා යොවුන් වියෙහි පසුවන කාන්තාවන්ගේ සාක්ෂරභාවය ප්‍රශස්ත මට්ටමක පැවති බව පැහැදිලි විය. සාක්ෂරභාවය නොමැති කාන්තාවන් තම දෛනික ජීවිතයේදී සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සම්බන්ධ කටයුතු වලදීත්, බාහිර සමාජ සම්බන්ධතා වලදීත්, විශේෂයෙන්ම තම දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධ කටයුතු වලදීත් විවිධාකර ගැටලු වලට මුහුණ දෙන බව පැහැදිලි විය. සාක්ෂරභාවය නොමැති කාන්තාවන්ට එසේ වීමට බලපෑ සාධක විමසීමේදී ඒ කෙරෙහි සමාජ ආර්ථික සාධක රැසක් බලපා ඇති බව පැහැදිලි විය. ආර්ථික ප්‍රශ්න ඒ අතර ප්‍රධාන තැනක් ගෙන ඇති බව පැහැදිලි විය. සාක්ෂරභාවය ලබාගැනීමටත් එය වැඩිදියුණු කර ගැනීමටත් මෙම කාන්තාවන් තුළ ධනාත්මක නැඹුරුවක් පවතින බවද මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය.

මොවුන්ගේ සාක්ෂරභාවය සම්බන්ධව පවත්නා ගැටලු නිරවුල් කර ගැනීමට ගතයුතු පියවරවල් වශයෙන් ක්‍රියාත්මක කළ හැකි වැඩ සටහන් කිහිපයක් පිළිබඳව මඟ පෙන්වීමක් ද මෙහි ඇතුළත් වේ.